මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

# පුරප්පාඩු නිවේදනය

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳ ප්‍රජාව විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල වෙළඳ ප්‍රජාව වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුව හරහා දැන්විය යුතු ය.

ඒ අනුව, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කර තිබේ. එබැවින්, වෙළඳ ජතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පහත තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.

P

## 1) ජ්‍යෂ්ඨ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පිරිවිතර නිළධාරී - සංවර්ධන (PS 5) - තනතුරු 01

### සුදුසුකම් සහ පළපුරුද්ද

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක මූලික උපාධියක්; **හෝ**
- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් තිබීම ; **හෝ**
- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 07 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 03 ක සේවා පළපුරුද්ද.

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 06 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ  අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්ද.

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදල තනතුරක් සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 05 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 13 ක පළපුරුද්ද.

## 2) පාර්ශවකරුවන්ගේ සන්නිවේදන සහ අලෙවිකරණ නිළධාරී (PS 6 A) - තනතුරු 01

### සුදුසුකම් සහ පළපුරුද්ද

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් සන්නිවේදනය, අලෙවිකරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක උපාධිය; **හෝ**
- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්; **හෝ**
- සන්නිවේදන හා අලෙවිකරණ ක්ෂේත්‍ර සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 07 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ  අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද.

**හෝ**

- සන්නිවේදන හා අලෙවිකරණය සඳහා වූ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 06 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 06 ක පළපුරුද්ද.

**හෝ**

- සන්නිවේදන හා  අලෙවිකරණ ක්ෂේත්‍ර සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 05 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**
- තනතුරට අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 11 ක පළපුරුද්ද.

P

### 3) කොන්ත්‍රාත් නිළධාරී (PS 6B) - තනතුරු 01

### සුදුසුකම් සහ පළපුරුද්ද

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, සැපයුම්දාම කළමනාකරණය, රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක්, **හෝ**
- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්, **හෝ**
- රාජ්‍ය ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවකින් හෝ පිළිගත් ආයතනයකින් ප්‍රසම්පාදනය පිළිබඳ වෙනත් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම; **සහ**
- කොන්ත්‍රාත් කළමනාකරණය හෝ ප්‍රසම්පාදන මෙහෙයුම් හෝ කොන්ත්‍රාත් පරිපාලනය හෝ මෙහෙයුම් පරිපාලනය කිරීම පිළිබඳ උපදෙස් දීමේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද (රජයේ ආයතනයක් වීම වඩාත් සුදුසුයි); **සහ**
- බහු පාර්ශ්වික සංවර්ධන නියෝජ්‍යායතන සමඟ (ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි) සැලකිය යුතු කොන්ත්‍රාත් පරිපාලන අත්දැකීම් තිබීම; **සහ**
- **MS Office** මෙවලම් භාවිතා කිරීමේ ප්‍රවීණතාවය.
- ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ අදාළ වන කොන්ත්‍රාත් නීති සහ රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් තිබීම.

### පොදු කොන්දේසි:

- **2025/08/04** වැනි දිනට වයස අවුරුදු 64 නොවැඩි විය යුතුයි.
- වාර්ෂික කාර්යසාධක ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 24 ක කාලසීමාව සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- **2025/08/04** වැනි දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට පැමිණිය හැකි අතර අනෙකුත් ප්‍රතිලාභ 2019 මාර්තු මස 05 දිනැති චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන පරිදි තනතුරට අදාළ PS කාණ්ඩයට අනුව හිමි වේ.

### අයදුම්කිරීමේ ක්‍රමවේදය:

සියලුම අයදුම්කරුවන් තම ජීව දත්ත පත්‍රිකාව සමඟ ඥාතීන් නොවන තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු (අවසන්වරට සේවය කල සේවා යෝජකයින් දෙදෙනාගෙන් විය යුතුය.) සහ සහතිකපත්වල සහතික කළ පිටපත් 2025/08/04 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට යොමු කළ යුතුය. දැනට රජයේ / අර්ධ රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා යොමු කල යුතුය. අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

**ලිපිනය:**

ව්‍යාපෘති අධ්‍යක්ෂ
වෙළඳ පාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය
03 වන මහල , "ලෝටස් ගොඩනැගිල්ල"
අරලියගහ මන්දිරය
කොළඹ 03

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර අසම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම හෝ අවශ්‍ය සියලුම ලේඛන ඉදිරිපත් නොකිරීම සුදුසුකම් නොලැබීමට හේතුවක් වනු ඇත.

තනතුරු පිළිබඳ විස්තර ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න **www.onetrade.lk**

**ලේකම්:**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01

දිනය: 2025/07/20